වයඹ පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ අතුරු වෛද්‍ය සේවා කාණ්ඩ 02 මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන් සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය

**01.** සම්බන්ධ වන ආයතන

1.1 දෙපාර්තමේන්තුව : වයඹ පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව

යොමු අංක : NWP/PDHS/E12/PHI/2 දිනය : 2019.

1.2 අමාත්‍යාංශය : වයඹ පළාත් සෞඛ්‍ය විෂය භාර අමාත්‍යාංශය

යොමු අංක : NWP/MH/E24/21 දිනය : 2019.08.21

1.3 කළමණාකරන සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම :

යොමු අංක : DMS/NW/03/01 VOLUME I දිනය :

1.4 වයඹ ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය :

යොමු අංක : NWPCS/AD/9/H/1-B දිනය : 2019/09/03

1.5 වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය :

යොමු අංක : PPSC/AD15/1/6/2/2019 දිනය 2019.10.24

1.6 වයඹ පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය

යොමු අංක : NWP/GOV/AD3/19/2/38 දිනය : 2019.11.20

**02.** පත් කිරීම් බලධරයා :

වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**03.** සේවා ගණය පිළිබඳ විස්තර

3.1 සේවා ගණය : අතුරු වෛද්‍ය සේවා අංක 02 ඛණ්ඩය

3.2 ශ්‍රේණි : III, II, I, අධි ශ්‍රේණිය

3.3 පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය

අතුරු වෛද්‍ය සේවා ගණයට අයත් මහජන සෞඛ්‍යයට අදාල රෝග නිවාරණය ප්‍රධාන අරමුණ කර ගත් පරිසර සෞඛ්‍ය කළමනාකරණය, බෝ වන සහ බෝ නොවන රෝග පාලනය , ආහාර සෞඛ්‍ය, ජල සනීපාරක්ෂාව , අපද්‍රව්‍ය කළමනාකරණය, වාහක පාලනය, ජලභීතිකා රෝග මර්ධනය. ගොඩනැගිලි හා ඉදිකිරීම් වල සෞඛ්‍යාරක්ෂිත බව තහවුරු කිරීම, ආපදා කළමනාකරණය, පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යන් සිදු කිරීම ඇතුලු සියළුම විෂයන්ට අදාල මහජන සෞඛ්‍ය අණපනත් බලාත්මක කිරීම සහ ක්‍රියාත්මක කිරීම, ආචාර්යවරයෙක් වශයෙන් උක්ත සියළු විෂයන්ට අවශ්‍ය තාක්ෂණික දැනුම ලබා දීම, අධීක්ෂණ නිලධාරියෙකු වශයෙන් කාර්ය මණ්ඩල සහ වැඩසටහන් අධීක්ෂණය හා පසුවිපරම් කටයුතු සිදු කිරීම.

3.4 කාර්යයන් පැවරීම :

ශ්‍රේණි ගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර, මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාවය මත ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාව පදනම් කොට ගෙන ඕනෑම ශ්‍රේණියක නිලධාරියෙකුට දෙපාර්තමේන්තු ප්‍රධානී විසින් පවරනු ලැබිය හැක.

**04.** තනතුරෙහි/තනතුරුවල ස්වභාවය : මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය.

සටහන : - විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට යටත් විය යුතුය.

මහජන සෞඛ්‍ය පරීක්ෂණ නිලධාරීන් සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය
2019.11.20 දින
වයඹ ආණ්ඩුකාරවර ලේකම්
දිනය: 2019.11.25

**05.** වැටුප

5.1 සේවා ගණයට අදාල වැටුප් කේත අංකය: MT 5-2016

5.2 වැටුප් පරිමාණය:රු.31635 10X 445 –11 X 660 – 10 X 730 – 10X 750 රු.58145

5.3 සේවා ගණයට අදාල ශ්‍රේණි ක්‍රමය හා ශ්‍රේණි ක්‍රමයට අදාල වැටුප් පියවර :

| ශ්‍රේණිය | අදාල ආරම්භක වැටුප් පියවර | |
|---|---|---|
| III | පියවර 01 | රු.31,635/ |
| II | පියවර 12 | රු.36745/= |
| I | පියවර 23 | රු.44.075/= |
| අධි | පියවර 32 | රු.50,645/= |

**06.** සේවා ගණයට අයත් තනතුරු -

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් - උපලේඛන 01.

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව :

- මහජන සෞඛ්‍ය පරීක්ෂක - 199
- පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂක- 21
- ආචාර්ය මහජන සෞඛ්‍ය පරීක්ෂක - 2
- ආහාර හා ඖෂධ පරීක්ෂක - 4

ශ්‍රේණියෙන් ශ්‍රේණියට උසස් කිරීමේ කාර්යය සඳහා III,II,I හා අධි ශ්‍රේණීන් සියල්ල ඒකාබද්ධ නිලධර සංඛ්‍යාවට අයත් සේ සැලකේ. එම සංඛ්‍යාව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය මත වරින් වර වෙනස් විය හැක.

**07.** බඳවා ගැනීම

7.1 බඳවා ගන්නා ප්‍රතිශතයන් ,

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | 100% |

7.2 විවෘත බඳවා ගැනීම

7.2.1 බඳවා ගන්නා ශ්‍රේණිය : III ශ්‍රේණිය

මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරින් සඳහා වන බඳවා ගැනීම් හා උසස් කිරීම් පරිපාටිය
[illegible] විසින්
2019.11.20 දින
[illegible]
වයඹ ආණ්ඩුකාරවර ලේකම්
දිනය: 2019.11.25.

7.2.2 සුදුසුකම් :

7.2.2.1 අධ්‍යාපන සුදුසුකම් / වෘත්තිය සුදුසුකම් :

| තනතුර | අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම් |
|---|---|
| මහජන සෞඛ්‍ය පරීක්ෂක | සිංහල / දෙමළ භාෂාව , ගණිතය, විද්‍යාව හා තවත් එක් විෂය කට සම්මාන සාමාර්ථය සහිතව ඉංග්‍රීසි භාෂාව ද ඇතුලුව විෂයන් 06 කින් දෙවරකට නොවැඩි වාර ගණනක දී අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වීම.<br><br>සහ<br>අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය ජීව විද්‍යාව හෝ සංයුක්ත ගණිතය විෂයට සම්මාන සාමාර්ථයක් සහිතව භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, කෘෂි විද්‍යාව යන විෂයන් අතරින් විෂයයන් 02 ක් එකවර සමත් වීම.<br>සහ<br>මහජන සෞඛ්‍ය පරීක්ෂක තනතුරෙහි කාර්ය භාරයට අදාලව සෞඛ්‍ය හා දේශිය වෛද්‍ය අමාත්‍යංශය මගින් මෙහෙයවනු ලබන වසර එක හමාරක පූර්ණ කාලීන වෘත්තීයමය ඩිප්ලෝමා (අභ්‍යන්තර) පාඨමාලාව සාර්ථකව හදාරා ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම. |

7.2.2.2. කායික සුදුසුකම් :

i. සෑම අපේක්ෂකයකුම වයඹ පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍ය තාවයකින් යුක්ත විය යුතුය.

ii. උස අඩි 5 යි අඟල් දෙක හෝ ඊට වැඩි විය යුතුය.

7.2.2.3. වෙනත්

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

ii. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

7.2.3. වයස :

7.2.3.1. අවම සීමාව අවුරුදු : 18 යි.

7.2.3.2. උපරිම සීමාව අවුරුදු : 30 යි.

මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන් සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය.
2019 . 11 . 20
දිනය: 2019 . 11 . 25 .

7.2.4. බඳවා ගැනීමේ ක්‍රමය :

රේඛිය සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ගැසට් මගින් ප්‍රකාශයට පත් කරනු ලබන කොන්දේසි වලට අනුව පුහුණුවට බඳවාගනු ලබන නිලධාරින්, එම පුහුණුව අවසානයේ මෙම පලාත් සභාවට අනුයුක්ත කිරීමෙන් පසු අන්තර්ග්‍රහණය කරගැනීම තුලින් III ශ්‍රේණියට බඳවාගැනීමේ විධිමත් පත්වීම් ලිපිය නිකුත් කරනු ලැබේ.

**08.** **කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ**

8.1

| කාර්යක්ෂමතා කඩඉම | කාර්යක්ෂමතා කඩයිම් පරීක්ෂණ පැවැත්වීම | කාර්යක්ෂමතා කඩ ඉමේ ස්වභාවය |
|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම | III වන ශ්‍රේණියට බඳවාගෙන වසර තුනක් (03) ගත වීමට පෙර | ලිඛිත පරික්ෂණයකි (විෂය නිර්දේශය උපලේඛණ 02 හි දැක්වේ) |
| 2වන කාර්යක්ෂමතා කඩඉම | II වන ශ්‍රේණියට උසස් වී වසර තුනක් (03) ගත වීමට පෙර | ලිඛිත , වාචික, ප්‍රායෝගික පරික්ෂණයකි . (විෂය නිර්දේශය උපලේඛණ 03 හි දැක්වේ) |
| 3වන කාර්යක්ෂමතා කඩඉම | I වන ශ්‍රේණියට උසස් වී වසර පහක් (05) ගත වීමට පෙර | ලිඛිත පරික්ෂණයකි . (විෂය නිර්දේශය උපලේඛණ 04 හි දැක්වේ) |

(එක් එක් කාර්යක්ෂමතා කඩයිම් වලට අදාල විෂය නිර්දේශයන් උපලේඛණ 2,3,4 හි දැක්වේ.)

8.2 කාර්යක්ෂමතා කඩඉම පවත්වනු ලබන කාල සීමාව: වර්ෂයකට දෙවරක්

8.3 කාර්යක්ෂමතා කඩඉම්වලට අදාල පරික්ෂණ පවත්වනු ලබන බලධාරියා:
සෞඛ්‍ය විෂය භාර රේඛිය අමාත්‍යාංශයේ ලේකම්

**8.4 ( අ) කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේ විෂය නිර්දේශය**

| එක් එක් බඳවා ගැනිම් පරිපාටිය යටතේ අනුරූපී වන කාර්යක්ෂමතා කඩඉම් පරික්ෂණයේ විෂයන් | |
|---|---|
| පැරණි බඳවා ගැනිම් පරිපාටිය | නව බඳවා ගැනිම් පරිපාටිය |
| <u>(1) 1 වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය හා දෙපාර්තමේන්තු පරික්ෂණය</u><br>• විෂය ක්ෂේත්‍රයට අදාල (ලිඛිත, වාචික, ප්‍රායෝගික)<br>• ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි | <u>(1) 1 වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය</u><br>• ආයතන සංග්‍රහය හා කාර්ය පරිපාටික රීති<br>• මුදල් රෙගුලාසි |

2019. 11. 20
2019. 11. 25.

| | |
|---|---|
| (2) II වන කාර්යක්ෂමත කඩඉම් විභාගය<br>• විෂය ක්ෂේත්‍රයට අදාල ප්‍රශ්න පත්‍රය<br>• කාර්යාල පරිපාලනය, ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි | (2) II වන කාර්යක්ෂමතතා කඩඉම් විභාගය<br>• විෂයානුබද්ධ (ලිඛිත, වාචික, ප්‍රායෝගික)<br>• ආයතන සංග්‍රහය<br>• මුදල් රෙගුලාසි |
| | (3) III වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය<br>• විෂයානුබද්ධ (බහුවරණ)<br>• විෂයානුබද්ධ (ව්‍යුහගත රචනා) |

(ආ) පැරණි බඳවා ගැනීමේ පරිපාටිය අනුව පළමු කාර්යක්ෂමතා කඩඉමෙහි ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි විෂය සමත් නිලධාරීන් මෙම බඳවා ගැනීමේ පරිපාටිය අනුව පළමු කාර්යක්ෂමතා කඩඉමෙන් නිදහස් කරනු ලැබේ.

(ඇ) මෙම බඳවා ගැනීමේ පරිපාටිය බලාත්මක වන දිනට පෙර පැවති බඳවා ගැනීම් පටිපාටි වල විධි විධාන යටතේ දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත් විය යුතු නිලධාරීන් පැවති බඳවා ගැනීමේ පරිපාටිය ට අනුව දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේ එක් එක් විෂයන්ට අනුරූපී වන මෙම බඳවාගැනීමේ පටිපාටිය යටතේ පැවැත්වෙන දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයේ විෂයන් සමත් වීමෙන් දෙවන කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කල යුතුය. අනුරූපී විෂයන් ඉහත වගුවේ දැක්වේ. පැරණි බඳවා ගැනීම් පටිපාටිය අනුව දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් අනුරූපී විෂයන් සමත් වී ඇත්නම් එම විෂයන් පමනක් බඳවා ගැනීම් පටිපාටිය යටතේ සමත් වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ.

(ඉ) නව බඳවා ගැනිමේ පරිපාටිය බලාත්මක වන දිනට පළමු ශ්‍රේණියේ වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණකර ඇති නිලධාරින් සඳහා තුන්වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ.

(ඊ) මෙහි උපඡේද අංක (ඇ) හි සඳහන් පරිදි සමත් විය යුතු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය වෙනස් වුව ද සමත් විය යුතුව තිබූ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයට අදාල කාල සීමාව වෙනස් නොවේ.

(උ) ආචාර්ය තනතුරෙහි සේවය කරන නිලධාරින් ජාතික සෞඛ්‍ය විද්‍යායතනය විසින් පවත්වනු ලබන ඉගැන්වීම් පිළිබඳ මාස 06 ක පුහුණු පාඨමාලාව සාර්ථකව නිමකර තිබීම හෝ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව හෝ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් පිළිගනු ලබන මාස 06 ට නොඅඩු ඉගැන්වීම් පිළිබඳ පාඨමාලාවක් හදාරා තිබේ නම් III වන කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් නිදහස් කරනු ලැබේ.

**09.** භාෂා ප්‍රවීණතාව

9.1

| භාෂාව | ලබා ගත යුතු ප්‍රවීණතාව |
|---|---|
| 01. රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැදුණු නිලධාරින් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය පරිවාස කාලය තුල දී ලබා ගත යුතුය. |
| 02. අනෙක් රාජ්‍ය භාෂාව | රා.පරි. චක්‍රලේඛ 1/2014 හා ඊට අනුෂාංගික චක්‍රලේඛ අනුව නියමිත මට්ටමේ ප්‍රවීණතාවය ලබා ගත යුතුය. |

**10.** **ශ්‍රේණි උසස් කිරිම.**

10.1 **III වන ශ්‍රේණියේ සිට II වන ශ්‍රේණියට උසස් කිරිම.**

10.1.1. සපුරාලිය යුතු සුදුසුකම් :

i. පත්වීම් ස්ථිර කර තිබීම

ii. නිලධාරී ගණයේ III වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර (10) සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත වැටුප් වර්ධක (10 ක්) උපයාගෙන තිබීම.

iii. අනුමත කාර්ය සාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර 10 ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහල කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

iv. උසස් කිරීමේ දිනට පූර්වාසන්න වසර 05 තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

v. අදාල මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීනතාව ලබාගෙන තිබීම.

vi. අදාල කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී තිබීම.

10.1.2 උසස් කිරිමේ ක්‍රමය :

සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයන් II වන ශ්‍රේණියට උසස් කිරීම සඳහා පත්කිරීම් බලධරයා වෙත අදාල නිලධාරියා විසින් නියමිත ආකෘති පත්‍රය අනුව ඉල්ලීමක් කරනු ලැබූ විට, පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි උසස්වීම් සිදු කරනු ලැබේ. අයදුම්පත ඇමුණුම් 01 හි දැක්වේ.

10.2 **II වන ශ්‍රේණියේ සිට I වන ශ්‍රේණියට උසස් කිරිම.**

10.2.1. සපුරාලිය යුතු සුදුසුකම් :

i. නිලධාරී ගණයේ II වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර (10) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත වැටුප් වර්ධක (10 ක්) උපයා ගෙන තිබීම.

ii. අනුමත කාර්ය සාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර 10 ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහල කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

iii. උසස් කිරීමේ දිනට පූර්වාසන්න වසර 05 තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

iv. අදාල කාර්යක්ෂමතා කඩඉම් පරික්ෂණය සමත් වී තිබීම.

10.2.1.2 උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සම්පූර්ණ කල නිලධරයන් I වන ශ්‍රේණියට උසස් කිරිම සඳහා පත් කිරීම් බලධරයා වෙත අදාල නිලධරයා විසින් නියමිත ආකෘති පත්‍රය අනුව ඉල්ලීමක් කරනු ලැබූ විට, පත් කිරිම් බලධරයා විසින් සුදුසුකම් පරික්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි උසස්වීම් සිදු කරනු ලැබේ.අයදුම් පත ඇමුණුම් 02 හි දැක්වේ.

10.3 **I වන ශ්‍රේණියේ සිට අධි ශ්‍රේණියට උසස් කිරිම.**

10.3.1. සපුරාලිය යුතු සුදුසුකම්

i. නිලධාරී ගණයේ I වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර (10) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත වැටුප් වර්ධක (10 ක්) උපයා ගෙන තිබීම.

ii. අනුමත කාර්ය සාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර 10 ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහල කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

iii. උසස් කිරීමේ දිනට පූර්වාසන්න වසර 05 තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

iv. අදාල කාර්යක්ෂමතා කඩඉම් පරික්ෂණය සමත් වී තිබීම.

2019.11.20
2019.11.25

10.3.2. උසස් කිරීමේ ක්‍රමය :

සුදුසුකම් සම්පූර්ණ කල නිලධරයන් අධි ශ්‍රේණියට උසස් කිරීම සඳහා පත් කිරීම් බලධරයා වෙත අදාල නිලධරයා විසින් නියමිත ආකෘති පත්‍රය අනුව ඉල්ලීමක් කරනු ලැබූ විට, පත්කිරීම් බලධරයා විසින් සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව සුදුසුකම් ලබන දින සිට ක්‍රියාත්මක වන පරිදි අධි ශ්‍රේණියට උසස් කිරීම පත් කිරීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

**සංලක්ෂය:**
ශ්‍රේණි වලට උසස් කිරීමේ දී නියමිත දිනට කාර්යක්ෂමතා කඩඉම සමත් නොවන නිලධාරීන්ගේ උසස් වීම් දිනය කාර්යක්ෂමතා කඩඉම සමත් වීමට ප්‍රමාද වූ කාලයට සමාන කාලයකින් ප්‍රමාද කල යුතුය.

**11. තනතුරු වලට පත් කිරීම.**

11.1 සුදුසුකම්

| තනතුර | සුදුසුකම් | තෝරාගනු ලබන ආකාරය |
|---|---|---|
| පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂක | (අ) සුදුසුකම්<br>i. මහජන සෞඛ්‍ය පරීක්ෂක තනතුරෙහි ස්ථිර කරන ලද නිලධරයෙක් වීම<br>ii. මහජන සෞඛ්‍ය පරීක්ෂක තනතුරේ I වන ශ්‍රේණියේ හෝ ඊට ඉහල නිලධාරියකු වීම<br>iii. පරිපාලන මහජන සෞඛ්‍ය පරීක්ෂක තනතුරෙහි කාර්යභාරයට අදාල ෆේඨිය සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් මෙහෙයවනු ලබන ත්‍රෛමාසික පූර්ණ කාලීන පුහුණු පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර තිබීම<br>iv. අයදුම්පත් කැඳවන අවසාන දිනට අඛණ්ඩ වසර පහක (05)ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම | අභ්‍යන්තර චක්‍රලේඛ මගින් / රජයේ ගැසට් පත්‍රය/ ප්‍රසිද්ධ දැන්වීම් මගින් අයදුම්පත් කැඳවා සුදුසුකම් ලත් අයදුම් කරුවන් පහත සඳහන් ලකුණු දීමේ ක්‍රමය පදනම් කර ගනිමින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරා ගනු ලැබේ.<br><u>ලකුණු දීමේ ක්‍රමය</u><br>සේවා පලපුරුද්ද (උපරිම ලකුණු 50)<br>උසස් අධ්‍යාපන සුදුසුකම් (උපරිම ලකුණු 20)<br>විශේෂ කුසලතාවයන් (උපරිම ලකුණු 10)<br>ඉංග්‍රීසි භාෂා ප්‍රවීණ තාවය (උපරිම ලකුණු 15)<br>සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාවය (උපරිම ලකුණු 05)<br>සටහන – ඉහත වගුවල දැක්වෙන ලකුණු ලබා දෙන නිර්නායකයන් සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු ප්‍රමාණයන් ඇතුලත එක් එක් යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ සඳහා සවිස්තරාත්මක ලකුණු පරිපාටිය උප ලේඛන 05 හි දැක්වේ |

මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන් සඳහා බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය
... විසින්
2019 . 11 . 20 දින
... බව
... කරමි.

.......................
වයඹ ආණ්ඩුකාරවර ලේකම්
දිනය: 2019 . 11 . 25 .



8

| | | |
|---|---|---|
| | | 3. සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත තනතුරුවලට පත් කරනු ලැබේ. මෙම තනතුරට පත් කිරීම හේතුවෙන් වැටුපෙහි හෝ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවේ. |
| ආචාර්ය මහජන සෞඛ්‍ය පරීක්ෂක | i. මහජන සෞඛ්‍ය පරීක්ෂක තනතුරෙහි ස්ථිර කරන ලද නිලධාරියෙකු විය යුතුය.<br>ii. මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරී තනතුරේ II වන ශ්‍රේණියට අයත් කාර්යක්ෂමතා කඩඉම් සමත්, II වන ශ්‍රේණියේ හෝ ඊට ඉහල නිලධාරියෙකු විය යුතුය.<br>iii. අයදුම්පත් කැඳවන අවසාන දිනට පූර්වාසන්න වසර (05)ක සතුටු දායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම. | අභ්‍යන්තර චක්‍රලේඛ මගින් / රජයේ ගැසට් පත්‍රය/ ප්‍රසිද්ධ දැන්වීම් මගින් අයදුම්පත් කැඳවා සුදුසුකම්ලත් අයදුම්කරුවන් යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක් හා ප්‍රායෝගික පරීක්ෂණයක් මගින් තෝරාගනු ලැබේ. **<u>යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු දීමේ ක්‍රමය</u>**<br>සේවා පලපුරුද්ද (උපරිම ලකුණු 40)<br>ඉගැන්වීමේ පලපුරුද්ද (උපරිම ලකුණු 05)<br>උසස් අධ්‍යාපන සුදුසුකම් (උපරිම ලකුණු 20)<br>විශේෂ කුසලතාවයන් (උපරිම ලකුණු 15)<br>ඉංග්‍රීසි භාෂා ප්‍රවීණ තාවය (උපරිම ලකුණු 15)<br>සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාවය (උපරිම ලකුණු 05)<br>සටහන - ඉහත වගුවල දැක්වෙන ලකුණු ලබා දෙන නිර්නායකයන් සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු ප්‍රමාණයන් ඇතුලත එක් එක් යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණ සඳහා සවිස්තරාත්මක ලකුණු පරිපාටිය උපලේඛන 06 හි දැක්වේ. මෙම යෝග්‍යතාවය ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ ලකුණු මත පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් හෝ පස් දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවක් ප්‍රායෝගික පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අතර එහිදී පරීක්ෂණ මණ්ඩලය විසින් ලබා දෙනු ලබන මාතෘකාවක් ඔස්සේ නිලධාරියා කරනු ලබන ඉදිරිපත් කිරීම සඳහා ප්‍රායෝගික පරීක්ෂණයේදී පහත නිර්නායකයන් පිළිබඳ අවධානය යොමු කර ලකුණු ලබා දෙනු ලැබේ.<br>-අරමුණ හා ප්‍රවිෂ්ඨවීම උපරිම ලකුණු 07<br>-පෞරුෂය හා හඬ පාලනය උපරිම ලකුණු 07<br>-සන්නිවේදනයේ පැහැදිලි බව උපරිම ලකුණු 07<br>-කාල කළමණාකරණය උපරිම ලකුණු 07<br>-ඉදිරිපත් කිරීමේ ශිල්පි ක්‍රම භාවිතය උපරිම ලකුණු 07 |

| | | |
|---|---|---|
| | | යෝග්‍යතාව ඇගයීමේ හා ප්‍රායෝගික පරීක්ෂණයෙන් ලබා ගන්නා මුළු ලකුණු වල කුසලතා අනුපිළිවෙල අනුව හා පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව අනුව අයදුම්කරුවන් ආචාර්ය තනතුර සඳහා පත්කරනු ලැබේ. |
| ආහාර හා ඖෂධ පරීක්ෂක | i මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරි තනතුරේ II වන ශ්‍රේණියට අයත් කාර්යක්ෂමතා කඩඉම් සමත් II ශ්‍රේණියේ හෝ ඊට ඉහල නිලධාරියෙකු විය යුතුය.<br><br>i. මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් සඳහා වන ලන්ඩනයේ රාජකීය සෞඛ්‍ය සංගමය විසින් පිරිනමනු ලබන ඩිප්ලෝමාව හෝ කලුතර ජාතික සෞඛ්‍ය විද්‍යායතනය හෝ ෆේඨීය සෞඛ්‍ය අමාත්‍යාංශය අනුමත පුහුණු මධ්‍යස්ථානයකින් හෝ පිරිනමනු ලබන ඩිප්ලෝමා සහතිකය හෝ මස් වර්ග හා අනෙකුත් ආහාර පරීක්ෂා කිරීම සඳහා ලන්ඩනයේ රාජකීය සෞඛ්‍ය සංගමය විසින් නිකුත් කරන ලද ඩිප්ලෝමාව හෝ ප්‍රවීනතා සහතිකයක් ලබා තිබීම හෝ ආහාර හා ඖෂධ පරීක්ෂා කිරීම සඳහා තෙමස් පුහුණුව කින් පසු සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද සහතිකය ලබා තිබීම.<br><br>ii. අයදුම්පත් කැඳවන අවසාන දිනට පූර්වාසන්න වසර (05) ක සතුටු දායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම. | අභ්‍යන්තර චක්‍රලේඛ මගින් / රජයේ ගැසට් පත්‍රය/ ප්‍රසිද්ධ දැන්වීම් මගින් අයදුම්පත් කැඳවා සුදුසුකම් ලත් අයදුම්කරුවන් පහත සඳහන් ක්‍රමය පදනම් කර ගනිමින් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරා ගනු ලැබේ.<br><br>ෆේඨීය සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් පවත්වනු ලබන ආහාර හා ඖෂධ පරීක්ෂක ප්‍රවීනතා විභාගය සමත් දිනය හා එම විභාගයේ කුසලතාවය පදනම් කරගෙන සකස් කරනු ලබන ජ්‍යෙෂ්ඨතා හා කුසලතා ලේඛනයක් අනුව සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව අදාල ලේඛනය අනුව අනුමත සේවක සංඛ්‍යාවේ පවතින පුරප්පාඩු සඳහා ඔවුන්ගේ කැමැත්තේ අනුපිළිවෙලට මනාපය ලකුණු කිරීමට අවස්ථාව ලබා දී පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සඳහා පත්කිරීම් බලධාරියා විසින් බඳවා ගනු ලැබේ. |

මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන් සඳහා බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය.
විසින්
2019.11.20 දින

වයඹ ආණ්ඩුකාරවර ලේකම්
දිනය 2019.11.25.

12. බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන දිනට සේවයේ යෙදී සිටින්නන් අන්තර්ග්‍රහණය කිරීමේ විධි විධාන

නව බඳවා ගැනීමේ පටිපාටිය ක්‍රියාත්මක වන දිනට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව MT 05 2016 වැටුප් පරිමාණයෙහි වැටුප් ලබන මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන් ප්‍රතිසංවිධිත අතුරු වෛද්‍ය සේවයට අන්තර්ග්‍රහණය කිරීම ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4 වන වගන්තිය විධිවිධාන වලට යටත්ව පහත පරිදි කරණු ලැබේ.

කෙසේවුවද අන්තර්ග්‍රහණය හේතුවෙන් අදාල නිලධාරියාගේ වැටුපෙහි හෝ වැටුප් වර්ධක දිනයේ වෙනසක් සිදු නොවිය යුතු අතර, එම දිනය අන්තර්ග්‍රහණයට පෙර පැවති වැටුප් වර්ධක දිනය වශයෙන් නොවෙනස්ව ක්‍රියාත්මක විය යුතුය. එසේම වැටුප් පරිවර්තනයේ දී අදාල තැනැත්තා අවසන් වරට ලබමින් සිටි වැටුප නව වැටුප් පියවර කට අනුරූපී වීම මත ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4.4 වගන්තිය අනුව ඊළඟ ඉහල වැටුප් පියවරේ තැබීම නොකළ යුතුය.

- සේවයේ II ආ ඛණ්ඩයේ නිලධාරීන් නව බඳවා ගැනීමේ පරිපාටියේ III ශ්‍රේණියට
- සේවයේ II අ ඛණ්ඩයේ නිලධාරීන් නව බඳවා ගැනීමේ පරිපාටියේ II ශ්‍රේණියට
- සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් නව බඳවා ගැනීම් පරිපාටියේ I ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරණු ලැබේ.
- සේවයේ I ශ්‍රේණියේ වසර දහයක (10) සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සහ I ශ්‍රේණියට අදාල වැටුප් වර්ධක දහයක් (10) උපයාගෙන ඇති නිලධාරීන් අධි ශ්‍රේණියට

13. මෙම බඳවා ගැනීමේ පරිපාටියේ විධි විධාන සලසා නොමැති කරුණු පිළිබඳව වයඹ පලාත් ගරු ආණ්ඩුකාරතුමාගේ තීරණය අවසන් තීරණය වේ.

14. අන්තර් කාලීන විධි විධාන

14.1 ශ්‍රේණි උසස් කිරීම් සම්බන්ධ විධි විධාන

වයඹ පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් මෙම පලාත් සභාවට අදාල කරන ලද වෛද්‍ය කර්මය සඳහා වූ පරිපූරක වෘත්තීන් ගේ සේවයේ හා අතුරු වෛද්‍ය සේවයේ I ශ්‍රේණියේ උසස් වීම් ලබා දීම යන මැයෙන් රේඛීය අමාත්‍යාංශයේ ගරු අමාත්‍යතුමා විසින්ඉදිරිපත් කරන ලද 2012.03.13දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා 2014.09.04 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී එලඹි අංක: අමප/12/0358/509/015 හා 2014.09.04 දිනැති තීරණ අනුව 2010.11.01 දින සිට 2015.12.31 දින දක්වා අන්තර් කාලය ක්‍රියාත්මක වේ. මෙම අන්තර් කාලය තුළ II ශ්‍රේණියේ හා Iශ්‍රේණියේ උසස් වීම් පහත පරිදි ලබා දෙනු ඇත.

14.1.1 II "අ" ඛණ්ඩයට / IIවන ශ්‍රේණියට උසස් කිරීම.

පුහුණු කාලය ද ඇතුලුව II "ආ" ඛණ්ඩයේ / IIවන ශ්‍රේණියේ වසර 08ක් සතුටු දායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති හා නියමිත දෙපාර්තමේන්තු පරීක්ෂණය හා කාර්යක්ෂමතා කඩඉම සමත් නිලධාරීන් II "අ" ඛණ්ඩයට/ II වන ශ්‍රේණියට උසස් කරනු ඇත.

මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන් සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කරන ලද බව සහතික කරමි.
වයඹ ආණ්ඩුකාරවර ලේකම්
දිනය: 2019.11.25

මහජන සෞඛ්‍ය පරීක්ෂක
නිලධාරීන් සඳහා බඳවා
ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය
2019.11.20
2019.11.25

14.1.2 I වන ශ්‍රේණියට උසස් කිරීම.

II අ ඛණ්ඩයේ / II වන ශ්‍රේණියේ වසර 09 ක සක්‍රිය හා සතුටු දායක සේවා කාලයක් සහිත මුල් පත්වීමේ දින සිට අවම වශයෙන් වසර 15 ක සේවා කාලයක් සම්පූර්ණ කරණ ලද නිලධාරීන් හිඟ වැටුප්, අතිකාල දීමනා හා අනිකුත් දීමනා ගෙවීමකින් තොරව අදාල සේවයේ I වන ශ්‍රේණියට උසස් කරනු ඇත.

සකස් කලේ :
අත්සන :- ......................................
(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධාරියා )
නම :- ......ඩබ්.එම්.ආර්. ගීතාංජලී විජයපාල......
තනතුර :- ......පරිපාලන නිලධාරී......
දිනය :- ......වයඹ පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය කුරුණෑගල......

පරීක්ෂා කලේ :
අත්සන :-......................................
(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියා )
නම :- ......අරුණි එස්. ජයවීර......
තනතුර :- ......නියෝජ්‍ය අධ්‍යක්ෂ (පරිපාලන)......
දිනය :- ......වයඹ පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය කුරුණෑගල......

නිර්දේශ කර ඉදිරිපත් කරමි. 2019.08.07

අත්සන :- ......................................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම :- ......වෛද්‍ය එච්. ෆරීඩ......
පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ
වයඹ පළාත
කුරුණෑගල
තනතුර :- ......................................

දිනය :- ....2019.08.07.................. නිල මුද්‍රාව :- ......................................

......................................................................................................................................................

යොමු අංක ..............................

වයඹ පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ මහජන සෞඛ්‍ය පරීක්ෂක තනතුරට බඳවා ගැනීමේ පටිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන :- ......................................
නම :- ......................................
ලේකම්,
......................................අමාත්‍යාංශය

තනතුර :- ......කාන්ති වේහැල්ල ලේකම්......
සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුබසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු අමාත්‍යාංශය (වයඹ)

දිනය :- ....2019/08/21.................. නිල මුද්‍රාව :- ......................................



12

යොමු අංක: NWP/CS/AD/9/H/1-13

වයඹ පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ මහජන සෞඛ්‍ය පරීක්ෂක තනතුරේ බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන:- ..........................................

නම:- ..........................................

ප්‍රධාන ලේකම් ජී.බී.එම්. සිරිසේන
වයඹ පළාත ප්‍රධාන ලේකම්
නිළ මුද්‍රාව:- වයඹ පළාත. 2019/09/03

..........................................................................................................................................

යොමු අංක : PPSC/AD15/1/6/2/2019

වයඹ පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ මහජන සෞඛ්‍ය පරීක්ෂක තනතුරේ බඳවා ගැනීමේ පටිපාටිය අනුමත කිරීම 2019.10.24. දින වයඹ පළාත් සහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලදී.

අත්සන :- ..................................

නම :- ..................................

ලේකම්, වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

තනතුර :- ආර්.එම්.ආර්.එම්. රත්නායක ලේකම් පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වයඹ පළාත.

දිනය :- 2019/11/11 ..................

නිල මුද්‍රාව :- ..................................

---

යොමු අංක:-

වයඹ පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ මහජන සෞඛ්‍ය පරීක්ෂක තනතුරේ බඳවා ගැනීමේ පරිපාටිය..................... දින ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලදී.

මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන් සඳහා වන බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය ගරු ආණ්ඩුකාරතුමා විසින් 2019.11.20 දින අනුමත කරන ලද බව සහතික කරමි.

..................................
වයඹ ආණ්ඩුකාරවර ලේකම්
දිනය: 2019.11.25.

අත්සන:- ..........................................

නම:- ..........................................

ආණ්ඩුකාර වර ලේකම්(වයඹ පළාත)



13